# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

# 10 ශ්‍රේණිය

## 4.0 ව්‍යාපාර ගනුදෙනු වාර්තා කරයි.

## 4.1 ව්‍යාපාරයක ගනුදෙනු ගිණුම්කරණ සමීකරණය ඇසුරින් ඉදිරිපත් කරයි.

### පැවරුම 01

1. ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ කුමක්ද?
2. ව්‍යාපාරික ගනුදෙනුවල ප්‍රතිඵල මොනවාද?
3. හිමිකම වෙනස්වන අවස්ථා 04ක් නම් කරන්න.
4. මධුරත්නගේ ව්‍යාපාරයේ 2021 මාර්තු මාසයේ පළමු සතිය තුළ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ
   a) 03.01 ප්‍රාග්ධනය ලෙස මුදල් යෙදෙව්වා රු 500 000
   b) 03.03 අත්පිට විකුණුම් රු 100 000
   c) 03.05 ණයහිමියෙකු වූ සමන්ට රු 55 000 ක් ගෙව්වා
   d) 03.06 විදුලිබිල ගෙව්වා රු 4 000.
   e) 03.08 මධුරත්න විසින් රු 2 000 ක නිවසේ දුරකථන බිල ව්‍යාපාරයේ මුදලින් ගෙව්වා.

   අවශ්‍ය වන්නේ

   1.ඉහත ගනුදෙනු පහත ගිණුම්කරණ සමීකරණයට ඇතුළත් කරන්න.

   වත්කම් = හිමිකම් + වගකීම්

   2.එක් එක් ගනුදෙනුවට අදාළ ද්විත්ව බලපෑම දක්වන්න.

5. ලක්ෂිකා විසින් 2021.01.01 දින ආරම්භ කල ව්‍යාපාරයේ ජනවාරි මාසයේ සිදු වූ ගනුදෙනු කිහිපයක <u>බලපෑම</u> ගිණුම්කරණ සමීකරණයේ සටහන් වී ඇති ආකාරය පහත දැක් වේ.

| දිනය | වත්කම් = | හිමිකම් + | වගකීම් |
|---|---|---|---|
| 2021.01.01 | වැඩි වේ | වැඩි වේ | |
| 2021.01.04 | වැඩි වේ<br>අඩු වේ | | |
| 2021.01.07 | අඩු වේ | අඩු වේ | |
| 2021.01.11 | අඩු වේ | | අඩු වේ |
| 2021.01.12 | අඩු වේ<br>වැඩි වේ | | |

මෙම ගිණුම්කරණ සමීකරණයට අනුව එක් එක් දින සිදු වූයේ යැයි අපේක්ෂා කල හැකි ගනුදෙනු වටිනාකම් සහිතව ලියන්න.